Operation Sovereign Borders

# මාධ්‍ය නිවේදනයයි

2013 නොවැම්බර් 22 සිකුරාදා

## ශ්‍රී ලංකාවෙන් ඔස්ට්‍රේලියාව බලා බෝට්ටු මඟින් ගිය ඉතිරි පිරිසත් ආපසු කොළඹට

ඔක්තෝබර් මස 10 වැනි දින ඔස්ට්‍රේලියාව බලා බෝට්ටු මඟින් නීති විරෝධී ලෙස පැමිනුණු ශ්‍රී ලාංකිකයන් 79 දෙනාම ආපසු සිය රට බලා සාර්ථක ලෙස එවීමට ඔස්ට්‍රේලියානු රජය කටයුතු කළේය.

මේ සතියේ දී අවසන් ශ්‍රී ලාංකිකයන් 6 දෙනා ද සිය රට බලා එවීමෙන් පසු පසුගිය මාසයේ දී ආපසු එවනු ලැබූ 73 දෙනා ද ඇතුළත් ව නීති වීරෝධී ලෙස බෝට්ටුවලින් ඔස්ට්‍රේලියාව බලා පැමිණිනු සියලු දෙනා අදාළ ආරක්ෂණ තක්සේරු ක්‍රියාවලියෙන් පසු ආපසු එවනු ලැබූහ.

රජය ක්‍රියාත්මක කරන නව ප්‍රතිපත්තිය තුළින් නීති විරෝධී ලෙස බෝට්ටු මඟින් ඔස්ට්‍රේලියාවට ඇතුළු වීමට උත්සාහ දරන පුද්ගලයන්ට ප්‍රබල පණිවුඩයක් සැපයෙන අතර එවැනි නීති විරෝධී ක්‍රමයකින් ඔස්ට්‍රේලියාවට පැමිණීමට උත්සාහ දරුවොත් සිදු වන්නේ ශ්‍රී ලංකාව බලා ආපසු පැමිණීමටයි.

"ඔස්ට්‍රේලියාවට වීසා නොමැති ව බෝට්ටු මඟින් පැමිණීමට උත්සාහ දරන පුද්ගලයන්ට ඔස්ට්‍රේලියාවේ රැඳී සිටීම වැළැක්වීම සඳහා ඔස්ට්‍රේලියානු රජය ගෙන ඇති ප්‍රතිපත්ති අන් කවරදාටත් වඩා මෙවර දැඩි වී තිබෙනවා" යැයි ආගමන සහ දේශසීමා රැකවරණ කටයුතු අමාත්‍ය ස්කොට් මොරිසන් මහතා අද පැවසීය. "2012 ඔක්තෝබර් මාසයේ සිට මේ දක්වා බෝට්ටු මඟින් ඔස්ට්‍රේලියාව බලා පැමිණුනු පුද්ගලයන් 1100කට වැඩි පිරිසක ආපසු සිය රටවල් බලා පිටත් කර යවා තිබෙනවා."

මෙයින් ලැබෙන පණිවුඩය ඉතා පැහැදිලියි.: ජාවාරම්කරුවන් වෙත මුදල් ගෙවා නීති වීරෝධීව මුහුදෙන් ඔස්ට්‍රේලියාවට ඇතුළු වීමට උත්සාහ දරන පුද්ගලයන්ගේ ජීවිත විශාල අවදානමකට පාත්‍ර වේ. එසේම ජාවාරම්කරුවන්ට රැවටීමෙන් ඔවුන්ගේ මුදල් ද අපතේ යනු ඇත. නීති විරෝධී ලෙස ඔස්ට්‍රේලියාවට පැමිණි පසු ඔවුනට එහිදී කිසි ලෙසකින්වත් වීසා ලැබෙන්නේ නැත. තමන් ගෙවූ මුදල් වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් ඔවුනට ආපසු ලැබෙන්නේ නැත. සිදු වන්නේ ඔවුනට ආපසු සිය ගම් රටවල් බලා පැමිණීමට සිදු වීමයි.

ශ්‍රී ලංකාවේ සිට ඔස්ට්‍රේලියාව බලා සිදු කෙරෙන පුද්ගල ජාවාරම් මැඩලීම සඳහා මෙහෙයුම් මට්ටමේ දී ඔස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව දැඩි සහයෝගීතාවකින් කටයුතු කරයි.

"ඔස්ට්‍රේලියානු රජය කිසිවිටෙකත් මේ සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය නොකරන අතර ජාවාරම්වලට එරෙහිව සටන් කිරීමට හා බෝට්ටු මඟින් නීති විරෝධි ලෙස පුද්ගලයන් රට තුළට ඇතුළු වීම වැළැක්වීමට සම්මත කර ගෙන ඇති ප්‍රතිපත්ති සහ යෝජනා අනුව කටයුතු කරනු ඇත" ඇමතිවරයා පැවසීය.

"බෝට්ටු මඟින් නීති විරෝධී ලෙස ඔස්ට්‍රේලියාව බලා ඇතුළු වීමට උත්සාහ දරන පුද්ගලයන් ආපසු එවීමට රජය අඛණ්ඩව කටයුතු කරනු ඇත"

ස්වේච්ඡාවෙන් තොරව ඉවත් කරන පුද්ගලයන්ට යළි සමාජගත වීම සඳහා ලබා දෙන ආධාර වැඩසටහන්වලට ඇතුළු වීමේ අවස්ථාවක් නොලැබෙනු ඇත.

**මාධ්‍ය විමසුම්:**

OSB සම්බන්ධ සියලු විමසීම් රේගු සහ දේශසීමා ආරක්ෂණ මාධ්‍ය අංශය වෙත යොමු කළ යුතු වේ. (02) 6275 6793